ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී (ගෞරව) උපාධි පාඨමාලාව - 3 වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය II – 2023/2024

**LLU 3505** - සාධාරණත්වය හා භාර නීතිය

කාලය : පැය එකයි (01)

දිනය : 2025 ජනවාරි 09 වේලාව : පෙ.ව. 09.30 - පෙ.ව. 10.30

මුළු ප්‍රශ්න ගණන : දෙකයි (02)

<u>එක් (01) ප්‍රශ්නයකට පමණක්</u> පිළිතුරු සපයන්න.

අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

01. 'නම්‍යශීලීභාවය සහ යුක්තිය සහතික කිරීමේ හැකියාව මත සාධාරණත්වයේ ප්‍රතිකර්ම බොහෝවිට ප්‍රශංසාවට ලක්වෙන නමුත් ඒවායේ පවතින අභිමතානුසාරී භාවය මත අධිකරණ තීන්දු වල අනපේක්ෂිත බව සහ නොගැලපීම් ඇතිවිය හැකි බව විචාරකයින් තර්ක කරනු ලබයි.'

ඉහත ප්‍රකාශය අනුව, සාධාරණත්වයේ ප්‍රතිකර්ම භාවිතය තුළ අධිකරණ අභිමතය සහ නෛතික නිශ්චිතතාවය අතර නිවැරදි සමතුලිත භාවයට බාධා පමුණුවන්නේද යන්න ඇගයීමකට ලක් කරන්න. ඒවායේ භාවිතය පාලනය කිරීම සඳහා දැඩි මාර්ගෝපදේශ තිබිය යුතුද, නැතහොත් ඒවායේ ආවේණික නම්‍යශීලීභාවය යුක්තියේ අවශ්‍යතා සඳහා වඩා හොඳින් ක්‍රියා කරන්නේද?

ඔබේ පිළිතුර උචිත අධිකාරීන් මගින් තහවුරු කළ යුතුය. (ලකුණු 20)

02. 'සිරිල්' විසින් මතුපිටින් පෙනෙන ආකාරය සම්පූර්ණ වූ නොතාරිස් පැවරුම්කරයක් හරහා 'පියල්' වෙත දේපළක් පවරයි. කෙසේ නමුත්, නියමිත දිනයකදී ගැණුම් මුදල ආපසු ගෙවනු ලැබීමෙන් පසු පියල් විසින් සිරිල් වෙත දේපළ නැවත පවරා දෙන බවට වාචික එකඟතාවයක් ඔවුන් සතු විය. මෙම වාචික එකඟතාවය සඳහා නොතාරිස් පැවරුම්කරයක් නොවීය. සිරිල් විසින් ගත් මුදල නියමිත දිනයකදී ගෙවනු ලැබුවද නොතාරිස් පැවරුම්කරයක් නොමැතිවීමේ හේතුව මත නැවත පැවරීමේ ගිවිසුම අවලංගු බව දක්වමින් පියල් දේපළ පැවරීම ප්‍රතික්ෂේප කරයි. පියල් තව දුරටත් කියා සිටින්නේ, පැවරුම් ලේඛනයේ පරම කොන්දෙසි මත මුදල් නැවත ආපසු ගෙවීම පිළිගැනීම හෝ දේපළ නැවත පැවරීමට තමා බැඳීමකට යටත් නොමැති බවයි.

භාර ආඥා පනතේ ප්‍රතිපාදන සහ යෝග්‍ය නඩු තීරණ හෝ උචිත නෛතික අධිකාරීන් ඇසුරින් සිරිල්ට උපදෙස් ලබා දෙන්න.

(ලකුණු 20)

-හිමිකම ඇවිරිණි-